දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832

ලේකම් / செயலாளர் / Secretary — 2784811

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50
Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ……………………………

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
இசுருபாய ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. — ED/01/26/23/02/01

දිනය / திகதி / Date — 2014-04- 30

චක්‍රලේඛ අංක - 15/2014

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## <u>පළාත් සහ කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම</u>

මහින්ද චින්තන ඉදිරි දැක්ම මධ්‍යකාලීන සංවර්ධන ප්‍රවේශයේ දක්වා ඇති පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉහළ නැංවීම සඳහා පළාත් හා කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම මත පදනම්ව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ද අනුදැනුම සහිතව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර එහි සඳහන් පහත නිර්දේශයන් අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

1. දැනටමත් කලාපයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කළමනාකාරිත්වය යටතට කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ද, පළාතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කළමනාකාරිත්වය යටතට පළාත් තොරතුරු හා සම්බන්ධීකරණ මධ්‍යස්ථාන ද පත්කිරීම සිදු කළ යුතු ය. (මෙය නව පත්කිරීමක් නොවේ)

   ඊට අමතරව සියලු ම මධ්‍යස්ථාන පරිපාලනය හා කළමනාකරණය අදාළ කලාප කාර්යාල මගින් පළාත යටතට පත්කිරීම සිදුවන අතර විෂයානුබද්ධ කාර්යයන් සම්බන්ධයෙන් වන පරිපාලන සහ කළමනාකරණ කටයුතුවල පමණක් අවසාන වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයභාර අධ්‍යක්ෂ වෙත පැවරීම සිදු කළ යුතු ය.

2. මෙම මධ්‍යස්ථාන දෙවර්ගය සඳහා පුහුණු කිරීමේ කටයුතු පිළිබඳ උපදේශකවරුන් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සඳහා තෝරාගනු ලැබූ ගුරු උපදේශකවරුන් තිදෙනකු අනුයුක්ත කිරීම මඟින් කළමනාකරණ, පරිපාලන කටයුතුවල හා පුහුණු වැඩසටහන්වල විධිමත් බව තහවුරු කරගැනීම හා ඵලදායීතාව තහවුරු කරගැනීම සිදු කළ යුතු ය.

3. පාසල් සිසුන්ට සහ පාසල් හැරගිය සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා දීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සමග සම්බන්ධීකරණයෙන් පාඨමාලා පැවැත්විය යුතු ය.

මීට අමතරව නව මධ්‍යස්ථාන සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී හා පවතින මධ්‍යස්ථාන කෙරෙහි පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකරමි.

I. මධ්‍යස්ථාන නොමැති කලාප හෝ පළාත් සඳහා නව මධ්‍යස්ථාන ඉදිකිරීමේදී ඒ ඒ කලාප හෝ පළාත්වලට අදාළ කලාප අධ්‍යාපන කාර්යාල හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු භූමියේ ඉදිකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ නොමැත්තේ නම් පමණක් මධ්‍යස්ථානයේ පරිපාලන හා කලමනාකරණ කාර්යයන්ගේ පහසුව සඳහා ඊට ආසන්නතම වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කළ යුතු ය.

II. කලාප පරිගණක මධ්‍යස්ථාන එම කලාපයේ තොරතුරු තාක්ෂණය ඉහළ නැංවීම සිදුකිරීමට අමතරව පාසල් පද්ධතියේ පවතින තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලබන මධ්‍යස්ථාන ජාලයක් (Information System Network) ලෙස ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වන අතර මෙහිදී එනම් කලාපය තුළ තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා මෙම මධ්‍යස්ථාන සක්‍රීයව යොදාගැනීමත් ඒ සඳහා වගකීම් පැවරීමත්, සම්බන්ධීකරණය කිරීමත් සිදු කළ යුතු ය.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. ජනාධිපති ලේකම්
2. විගණකාධිපති
3. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
4. පළාත් ප්‍රධාන ලේකම්
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
6. අධ්‍යාපන අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, අධ්‍යාපන අමාත්‍යාංශය